# A Gendered Study of Folk Poetry

Nadeeka Sandamali Pieris.
Department of Sinhala, Faculty of Humanities and Social Sciences,
University of Ruhuna
nadeeka.pieris@yahoo.com

Gender-based moral laws and value systems create diversity in the social community. The concept of gender has been identified based on the biological difference between the genders as well as the social conditions that belong to both sides of society. Although there is a biological difference here, Anne Oakley, a Western anthropologist, is of the opinion that gender is not a biological term but a term with a psychological and cultural meaning. Society has ascribed gender roles to these two parties as they have gendered heteronormative behaviours. Ancient folk poetry reveals that different social roles and social conditions between men and women have been recreated since ancient times. The family corporation depicted in folk poetry presents gender roles and physical and mental interrelationships with the concepts of kinship and marriage. The purpose of this study is to examine how the performance of gender roles in contemporary rural society is depicted in folk poetry. This research is related to the problem of how the concept of equality between the genders is depicted in relation to the gendered character as prevalent at the time socially as depicted in folk poetry. Primary data collection was conducted through library reference and via the Internet. Data analysis was done under the qualitative data analysis method with folklore and gender theory as the primary theoretical aspect of this research. The study of the family was limited to the study of folk poetry based on the concepts of kinship and marriage and it was concluded that the activities of different gender characters are depicted in the folk poems. Family work in the common residence, economic cooperation, sexual reproduction, and education could be identified from the selected folk poetry.

**Key Words**: Folk Poetry, Gender, Female Characters, Male Characters

# ජනකවිය පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අධ්‍යයනයක්

නදීකා සඳමාලි පීරිස්
සිංහල අධ්‍යයනාංශය, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය,
රුහුණ විශ්වවිද්‍යාලය

ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳි ධර්මතා, නීති හා හර පද්ධති සමාජ ප්‍රජාව තුළ විවිධත්වයක් උසුලයි. ස්ත්‍රී පුරුෂ ජීව විද්‍යාත්මක වෙනස මත මෙන් ම, සමාජයෙහි එම දෙපක්ෂයට හිමි සමාජ තත්ත්වයන්හි ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංකල්පය හඳුනා ගෙන තිබේ. මෙහි දී ජීව විද්‍යාත්මක වෙනසක් දැක්වුව ද අපරදිග මානව විද්‍යාඥවරියක වූ ඈන් ඕක්ල්ගේ අදහස වනුයේ මෙම ස්ත්‍රී පුරුෂ සමාජභාවය ජීව විද්‍යාත්මක නො ව මනෝ විද්‍යාත්මක හා සංස්කෘතික ගම්‍යයක් සහිත යෙදුමක් බව යි. සමාජය මෙම දෙපක්ෂයට ස්ත්‍රී පුරුෂ සමාජභාවී වශයෙන් විසම ගති පැවතුම් ආරෝපණය කර ඇති ලෙසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකා ඔවුන්ට ආරෝපණය කර දී තිබේ. පුරාතනයේ සිට ස්ත්‍රිය හා පුරුෂයා අතර විසම සමාජ භූමිකා හා සමාජ තත්ත්ව ප්‍රතිනිර්මාණය කර තිබෙන බව පුරාතන ජන කවියෙන් හෙළි වේ. ජන කවියෙන් නිරූපණය වන පවුල් සංස්ථාව, ඥාතිත්වය හා විවාහය යන සංකල්ප ඇසුරෙන් ස්ත්‍රී පුරුෂ භූමිකා හා කායික, මානසික අන්තර් සම්බන්ධතා පිළිබඳ ඉදිරිපත් වෙයි. තත්කාලීන ගැමි සමාජයෙහි ස්ත්‍රී පුරුෂ චරිතයන්ගේ ක්‍රියාකාරිත්වය ජනකවියෙන් නිරූපණය වන ආකාරය විමසා බැලීම මෙම අධ්‍යයනයෙහි අරමුණ යි. ජනකවියෙන් නිරූපිත තත්කාලීන සමාජයේ ස්ත්‍රී පුරුෂ චරිත ඇසුරෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවී සංකල්පය නිරූපණය වන්නේ කෙසේ ද? යන පර්යේෂණ ගැටලුවට අදාළ ව සිදු කළ මෙම පර්යේෂණයේ දී පුස්තකාල පරිශීලනය හා අන්තර්ජාලය මගින් දත්ත එක් රැස් කිරීම සිදු කෙරිණි. ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමය යටතේ දත්ත විශ්ලේෂණය සිදු කළ අතර, මෙම පර්යේෂණයේ දී ජනකවි හා ස්ත්‍රී පුරුෂ සමාජභාවී න්‍යාය ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ගැනෙයි. එහි දී පවුල, ඥාතිත්වය හා විවාහය යන සංකල්ප පදනම් කර ගත් ජනකවි පමණක් අධ්‍යයනයට සීමා කර ගැනුණු අතර, ජන කවියෙන් විවිධ ස්ත්‍රී, පුරුෂ චරිතවල ක්‍රියාකාරකම් නිරූපණය වන බව නිගමනය විය. විශේෂයෙන් පවුලේ කාර්යභාරයේ දී එනම් පොදු වාසය, ආර්ථික සහයෝගීතාව, ලිංගික ප්‍රජනනය හා අධ්‍යාපනයේ දී ස්ත්‍රී පුරුෂ ක්‍රියාකාරිත්වය ජනකවියෙන් හඳුනා ගත හැකි විය.

**ප්‍රමුඛ පද :-** ජන කවිය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ස්ත්‍රී චරිත, පුරුෂ චරිත